සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

Learning Resource Center
R
De Mazenod College

# පළමු වාර පරීක්ෂණය - 2025

# බුද්ධ ධර්මය

09 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ | 09.05.2025 |
|---|---|

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. බුද්ධ මාතා යන ගෞරව නාමයෙන් හැඳින්වෙන්නේ,
    (1) මහාමායා දේවිය (2) භද්දකච්චානා කුමරිය
    (3) මහා ප්‍රජාපතී ගෝතමිය (4) යශෝදරා දේවිය
02. මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ මව්පියන්,
    (1) අංජන රජු සහ යශෝදරා දේවිය
    (2) කොසොල් රජු සහ කෝසල මල්ලිකා බිසව
    (3) අංජන රජු සහ මහමායා දේවිය
    (4) සුප්‍රබුද්ධ රජු සහ අමිතා දේවිය
03. සිව් මසකින් තමන් වහන්සේ පිරිනිවන් පාන බව බුදුන් වහන්සේ වදාළ විට දැඩි අධිෂ්ඨානයෙන් යුතුව ධර්මය අවබෝධ කොටගත්තේ,
    (1) ආනන්ද තෙරණුවන් (2) ධර්මාරාම තෙරණුවන්
    (3) අංගුලිමාල තෙරණුවන් (4) සැරියුත් තෙරණුවන්
04. බුදුන් වහන්සේ අවසාන වස් කාලය ගතකළේ,
    (1) සැවැත් නුවර (2) කුසිනාරා නුවර
    (3) බේලුව ගමේ (4) ඉසිපතනයේ
05. "සූකර මද්දවය" නම් විශේෂිත ආහාරය බුදුරදුන්ට පූජා කළේ,
    (1) සොත්ථිය බමුණා (2) උපක ආජීවක
    (3) චුන්ද කර්මාර පුත්‍රයා (4) ආනන්ද හිමි
06. ධම්ම පදය ඇතුළත් වන පිටකය වන්නේ,
    (1) සූත්‍ර පිටකය (2) විනය පිටකය
    (3) අභිධර්ම පිටකය (4) ධර්ම පිටකය
07. බුදුරජාණන් වහන්සේගේ "තාදී ගුණය" යනු,
    (1) අකම්පිත බවයි. (2) කරුණාවන්ත බවයි.
    (3) තමාශීලී බවයි. (4) අගතිගාමී බවයි.
08. සොළොස්මස්ථානයට අයත් නොවන අනුරාධපුරයේ පිහිටි සිද්ධස්ථාන දෙක වන්නේ,
    (1) ලෝවාමහාපාය, ශ්‍රී මහාබෝධිය (2) ලංකාරාමය, ලෝවාමහාපාය
    (3) ලංකාරාමය, ථූපාරාමය (4) ථූපාරාමය, මිරිසවැටිය
09. බෞද්ධයන් ශ්‍රී පාද වන්දනාවේ යෙදෙන්නේ,
    (1) නොවැම්බර් - ජනවාරි (2) දෙසැම්බර් - මාර්තු
    (3) ජනවාරි - අප්‍රේල් (4) දෙසැම්බර් - මැයි

10. හවත්නි, මහණ ගොයුම්හු වූ කලී විශිෂ්ට රූප සම්පත්ති ඇත්තේ ය. දැකුම්කලු ය. ප්‍රස
ජනකය...''යනුවෙන් බුදුරදුන් වර්ණනා කළේ,

(1) කසී භාරද්වාජ බ්‍රාහ්මණයා
(2) චංකී බ්‍රාහ්මණයා
(3) සෝණදණ්ඩ බ්‍රාහ්මණයා
(4) පුක්කුසාති බ්‍රාහ්මණයා

11. වේළුවනාරාමය පුදන ලද්දේ,

(1) බිම්බිසාර රජතුමා
(2) අජාසත් රජතුමා
(3) අනේපිඩු සිටුතුමා
(4) කොසොල් රජතුමා

12. එක වර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් ආත්ම භාව සිහිකිරීමට සමත් අභිඥා සහිත භික්ෂුණී
අතර අග්‍රස්ථානය හිමිවූයේ,

(1) මහා ප්‍රජාපතී දේවියටයි.
(2) භද්දකච්චානා තෙරණියටයි.
(3) කිසාගෝතමියටයි.
(4) පටාචාරාවන්ටයි.

13. ''කැලේ තිබෙන කොයි දේවත් රස වේවා
මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා'' මෙම කොටස අඩංගු වන්නේ,

(1) සිරිත් මල්දමෙහි
(2) යශෝදරාවතෙහි
(3) ලෝවැඩ සඟරාවෙහි
(4) සුභාෂිතයෙහි

14. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පස්වන වර්ෂයේ බක් පොහොය දිනක වැඩ[illegible] ක
ලංකාද්වීපයේ,

(1) මහියංගණයට
(2) නාගදීපයට
(3) රුවන්වැලි මහා සෑයට
(4) කැලණියට

15. බුදුරජාණන් වහන්සේගේ දේහයේ ආදාහන කටයුතු ප්‍රමුඛ වශයෙන් සංවිධානය ක
ලද්දේ,

(1) ලිච්ඡවී රජ දරුවන්
(2) මල්ල රජ දරුවන්
(3) කොසොල් රජතුමා
(4) බිම්බිසාර රජතුමා

16. මෙලොව පරලොව සැප පිණිස පිළිගත්වනු ලබන දානය පිළිගැනීමට සුදුසු හෙයින්
සංඝරත්නය,

(1) ආහුනෙය්‍යය වන සේක.
(2) පාහුනෙය්‍යය වන සේක.
(3) දක්ඛිණෙය්‍ය වන සේක.
(4) අඤ්ජලිකරණීය වන සේක.

17. සතර බ්‍රහ්ම විහරණවලට අයත් නොවන්නේ,

(1) කරුණා (2) මෙත්තා (3) භාවනා (4) මුදිතා

18. ''තමාට තමා ම පිහිටකොට ධර්මය සරණකොට වාසය කරන්න.'' බුදුන් වහන්සේ
ප්‍රකාශය කළේ,

(1) මුගලන් හිමියන්ට
(2) සැරියුත් හිමියන්ට
(3) ආනන්ද හිමියන්ට
(4) දේවදත්ත හිමියන්ට

19. අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇතිවූවක් සේ සලකා සතුටට පත්
ස්වභාවය,

(1) මෙත්තාවයි.
(2) කරුණාවයි.
(3) මුදිතාවයි.
(4) උපේක්ඛාවයි.

20. සැදැහැතියන් විසින් දැක සංවේග පහළ කළ යුතු ස්ථාන ගණන,

(1) දෙකකි.
(2) හතරකි.
(3) තුනකි.
(4) දහයකි.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (1) බුදුරජාණන් වහන්සේට ඇති වූ මාරාන්තික රෝගය කුමක් ද?

(2) පිරිනිවන් පාන විට බුදුරජාණන් වහන්සේගේ ආයු කාලය කොපමණ ද?

(3) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ ස්ථානය කුමක් ද?

(4) කාලසිලාවේ දී පිරිනිවන් පෑ මහරහතන් වහන්සේ කවුද?

(5) බුදුරජාණන් වහන්සේගේ අවසාන බුද්ධ වචනය කුමක් ද?

(6) නායකයකු සතු ගුණාංග 3 ක් ලියන්න.

(7) ''යථාවාදී තතාකාරී'' යන්නෙහි තේරුම ලියන්න.

(8) සංඝයා වහන්සේ සතු ගුණ ගණන කීය ද?

(9) ළඟව පළාතේ පිහිටා ඇති බුදුරජාණන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් ගතකළ ස්ථානයේ වර්තමානයේ දක්නට ලැබෙන විහාරස්ථානය නම් කරන්න.

(10) සර්වඥ ධාතු වැඩි ප්‍රමාණයක් නිදන්කොට සාදා ඇති මහා සෑය කුමක් ද?

(ල. 2 x 10 = 20)

02. (1) සිදුහත් කුමරු දඹරුක් සෙවණේ වැඩූ භාවනාව කුමක් ද?

(2) ආනාපානසති භාවනාව හඳුන්වන්න.

(3) අධ්‍යාපන කටයුතුවලදී ආනාපානසති භාවනාවෙන් ලැබෙන පිටුවහල පහදන්න.

(ලකුණු 10)

03. (1) ''සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා....'' මෙම කවිය සම්පූර්ණ කරන්න.

(2) මෙම කවිය අඩංගු කෘතිය කුමක් ද?

(3) සඟ ගුණ ලියා දක්වන්න. (ලකුණු 10)

04. (1) බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කළ අවස්ථාවන් දෙකක් ලියන්න.

(2) මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 3 ක් ලියන්න.

(3) බුද්ධ මාතාවට හිමි වූ උත්තම ආචාරය කුමක් ද? (ලකුණු 10)

05. (1) ''සුකරානි අසාධුනී'' ගාථාව සම්පූර්ණ කරන්න.

(2) ආනන්තරීය පාපකර්ම 3 ක් ලියන්න.

(3) ''සාධු චරියා'' යන්න හඳුන්වන්න. (ලකුණු 10

06. (1) අනුරාධපුර අටමස්ථානය නම් කරන්න.

(2) බුදුන් වහන්සේ ලක්දිවට වැඩම කළ ස්ථාන තුන පිළිවෙළින් නම් කරන්න.

(3) ඔබ වන්දනා ගමනක් යාමට බලාපොරොත්තු වන්නේ නම් එහිදී අනුගමනය කළයු සිරිත් විරිත් 5 ක් ලියන්න. (ලකුණු 1

07. (1) චතු අප්පමඤ්ඤා ලෙස හැඳින්වෙන්නේ කුමක් ද?

(2) සිව් බඹ විහරණයෙන් යුතු ව වාසය කිරීම තම දියුණුවට හිතකර වන්නේ කෙසේ ද

(3) අෂ්ට ලෝක ධර්ම මොනවා ද? (ලකුණු